# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## විවෘත සහ දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රය

### ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය

### (බාහිර) - 2007

**සිංහල - SINH-E1015**

**නාට්‍ය කලාව, නූතන සිංහල කාව්‍යය හා ප්‍රබන්ධ කථා**

**පළමුවන කොටසේ ප්‍රශ්නය ද, දෙවන හා තුන්වන කොටස්වලින් ප්‍රශ්න දෙක (02) බැගින් ද තෝරාගෙන ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.**

ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි | කාලය : පැය 03 යි

---

## පළමුවන කොටස

01. පහත සඳහන් පැදි පෙළ විවේචනය කරන්න.

**එතෙර ගිය පොඩි දුවට**

වැහැරී ගිය උකුලේ නැත
සුව යහනක් සැදුණේ
වියැළී ගිය දෙතනේ නැත
කිරි බිඳුවක් එරුණේ
කප පවතින තුරු නොනිමෙන
සුසුමෙන් සමු ගැනුණේ
හිරු ගිලිහෙන මොහොතක තුඹ
මග අයිනක රැඳුණේ

උපන් බිමට නුඹ වැඩිවා මීසක  දුවේ
වැදූ මවට නුඹ වැඩියක් වීද  දුවේ
දුක උහුලා ඉන්නට මට හැකිය  දුවේ
නැව් නැගිලා දුරු රටකට යන්න  දුවේ

'පෙර කළ මහ පින් මහිමෙනි
මේ දෙස උපදින්නේ'
ඉපදෙන මීස රැඳෙනා පින
ඇයි නුඹ සතු නොවුණේ
දරුවන් ඇස කඳුලින් ළය
උණුවන මිනිසුන්නේ
සරණින් ලොව කොතැනක වුව
සැනහෙන් දියණියනේ

මතු යම් දිනෙක සිතුවිල්ලෙන් සිටින  සඳ
දැතක පහස සිහිනෙක මෙන් දනේ  විද
සිතියම් පොතින් ලොව විමසා බලන  සඳ
කඳුලක හැඩය මහ සයුරේ දකී  විද

## දෙවන කොටස

02. 70 දශකයේ දී සාහිත්‍ය ක්ෂේත්‍රයේ මතු වූ ජනතාවාදී සංකල්පය සිංහල කවියේ අභිවර්ධනයට තුඩුදුන්නේ දැයි නිදසුන් මගින් පරීක්ෂා කරන්න.

03. ''ගැටුම නාට්‍යයේ මූලික අවශ්‍යතාවකි. ගැටුමක් නැති තැන නාට්‍යයක් නැත.'' විමසන්න.

**නැතහොත්**

සංස්කෘත නාට්‍යවල ක්‍රියා විකාශනය හා බැඳුණු ප්‍රධාන අවස්ථා නිදසුන් අනුසාරයෙන් පැහැදිලි කරන්න.

04. ''රත්නාවලී නාට්‍යය වූකලී සංස්කෘත නාට්‍ය ශිල්පීය ක්‍රම පිළිබඳ පෘථුල අවබෝධයක් ඇත්තකුගේ නිර්මාණයකි.'' විමසන්න.

## තුන්වන කොටස

05. ''වර්තමාන සිංහල කෙටිකතාව, 19 වන සියවසේ දෙවන භාගයේ දී මෙරට ඇති වූ ශාස්ත්‍ර පුනර්ජීවනයේ ප්‍රතිඵලයකි.'' මේ ප්‍රකාශයේ සත්‍යාසත්‍යතාව පරීක්ෂා කරන්න.

**නැතහොත්**

හැත්තෑවෙ දශකයෙන් පසු රචනා වූ සිංහල කෙටිකතාවලින් ඉස්මතු වී පෙනෙන ප්‍රවණතා පිළිබඳ විමර්ශනයක් කරන්න.

06. පහත සඳහන් කෙටිකතාවලින් **එකක** කලාත්මක අගය පිළිබඳ විවරණයක් කරන්න.

1. වැද්දන් සමග යුද වදින්නට
2. තාත්තාගේ මළගම
3. ශෝක වන්නන් අතර

07. ''නවකතාකරුවාගේ විෂය ක්ෂේත්‍රය අසීමිත වන හෙයින්, ජීවිතය, සමාජය හා මානව ධර්මතා පිළිබඳ ගැඹුරු විවරණයක් කළ හැකිය.'' අද්‍යතන සිංහල නවකතා ඇසුරින් මේ අදහස පරීක්ෂා කරන්න.

08. ''තෘෂ්ණාභරණ, පැරණි සිංහල බණකථා සාහිත්‍යයෙන් ලද ආභාසය ප්‍රකට කරන නවකතාවකි.'' විමසන්න.

**********************